# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2449/05 - 2025 අගෝස්තු මස 12 වැනි අඟහරුවාදා - 2025.08.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: KDS/GIK/4/4/1/37.
*ඉඩම් අමාත්‍යාංශයේ අංකය*: 4-3/18/2021/WS/172.

**හෙම්මාතගම ජල සම්පාදන ව්‍යාපෘතියේ, ජල පවිත්‍රාගාරය පුළුල් කිරීම සඳහා අමතර ඉඩම් කොටසක් හා තුළුමුවේ සිට ජල පවිත්‍රාගාරය දක්වා ප්‍රවේශ මාර්ගය හා නළ එළීම සඳහා ඉඩම් අත්කර ගැනීම.**

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :-*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, ගඟ ඉහළකෝරළේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 1058 - වැටකේදෙණිය ග්‍රාම නිලධාරි වසමේ පිහිටි මැණුම්පති විසින් මැන පිළියෙල කරන ලද අංක 320721 (04) 01 දරන පිඹුරේ කැබලි අංක 02, 03 හා 04 දක්වා ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.434 ක් වන කබලකාව නම් ඉඩම් කොටස.

01. කැබලි අංකය 02
කැඩැස්තර සිතියම් අංකය: 320721 (04) 01; ඉඩමේ නම: කබලකාව; හිමිකම් කියන අයගේ විස්තර: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.2316.

02. කැබලි අංකය 03
කැඩැස්තර සිතියම් අංකය: 320721 (04) 01; ඉඩමේ නම: කබලකාව; හිමිකම් කියන අයගේ විස්තර: ඩබ්ලිව්. එච්. එම්. බුවනෙක බණ්ඩාර පිලපිටිය; ප්‍රමාණය: හෙක්. 0.1012.

03. කැබලි අංකය 04
කැඩැස්තර සිතියම් අංකය: 320721 (04) 01; ඉඩමේ නම: කබලකාව; හිමිකම් කියන අයගේ විස්තර: ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව; ප්‍රමාණය: හෙක්. 0.1012.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 සැප්තැම්බර් මස 29 වැනි දින ප. ව. 2.00 ට ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2025 සැප්තැම්බර් මස 15 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල

ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

**එස්. එම්. සී. සමරකෝන්,**
ප්‍රාදේශීය ලේකම්,
ගඟ ඉහළ කෝරළේ.

ගඟ ඉහළ කෝරළේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08 - 0101

---

## ශුද්ධි පත්‍රය

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය*: WGSWD&EIP/ACQ/KB/21 Vol I.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4/3/10/2013/LRB/155.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 1968/14 හා 2016.05.25 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* මවිසින් පළ කරන ලද 7 වැනි වගන්තිය යටතේ දැන්වීම පහත පරිදි සංශෝධනය කරන බව මෙයින් දැනුම් දී සිටිමි.

කොළඹ දිස්ත්‍රික්කයේ, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, 533 බොරලැස්ගමුව නැගෙනහිර A ග්‍රාම නිලධාරි වසමේ, බොරලැස්ගමුව ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කර ඇති අංක 9585 හා 2016.03.10 දිනැති මූලික පිඹුරේ කැබලි අංක 25 හා 26 දරන ඉඩම් කැබලි, සර්වේයර් ජනරාල්ගේ 2025.07.18 දිනැති, අංක CO/DSO/2025/178 දරන අනුරේඛනයේ කැබලි අංක A, B, C හා D මගින් සංශෝධනය කර, අංකනය කර පහත පෙන්වා ඇත.

01. **කැබලි අංකය A (25 වැනි ඉඩම් කැබැල්ලේ කොටසක්)**
ඉඩමේ නම: බක්මීගහදෙණිය සහ බක්මීගහකුඹුර; විස්තරය: වැව සහ වැව් කණ්ඩිය; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: -; ප්‍රමාණය: හෙක්. 0.0070.

02. **කැබලි අංකය B (25 වැනි ඉඩම් කැබැල්ලේ කොටසක්)**
ඉඩමේ නම: බක්මීගහදෙණිය සහ බක්මීගහකුඹුර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: එන්. ඒ. ප්‍රියංකා විසින් භුක්ති විඳි බවට පෙන්වන ලද කොටස; ප්‍රමාණය: හෙක්. 0.0094.

03. **කැබලි අංකය C (26 වැනි ඉඩම් කැබැල්ලේ කොටසක්)**
ඉඩමේ නම: බක්මීගහදෙණිය සහ බක්මීගහකුඹුර; විස්තරය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: එන්. ඒ. ප්‍රියංකා විසින් භුක්ති විඳි බවට පෙන්වන ලද කොටස; ප්‍රමාණය: හෙක්. 0.0160.

04. **කැබලි අංකය D (26 වැනි ඉඩම් කැබැල්ලේ කොටසක්)**
ඉඩමේ නම: බක්මීගහදෙණිය සහ බක්මීගහකුඹුර; විස්තරය: වැව, වැව් කණ්ඩිය සහ ගෙවත්ත; හිමිකම් කියන්නා: රජය; මුල් හිමිකම් කියන්නා: එන්. ඒ. ප්‍රියංකා විසින් භුක්ති විඳි බවට පෙන්වන ලද කොටස; ප්‍රමාණය: හෙක්. 0.0738.

**එච්. තිලකවර්ධන,**
ඉඩම් අත්කර ගැනීමේ නිලධාරි, වේරස් ගඟ
වැසි ජල අපවහන හා පරිසරය වැඩිදියුණු කිරීමේ
ව්‍යාපෘතිය, කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය.

2025 අගෝස්තු මස 05 වැනි දින,
වේරස් ගඟ වැසි ජල අපවහන හා
පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය,
අංක 03, ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ, රාජගිරිය.

EOG 08 - 0102

---

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: KDS/TUM/04/01/06/08.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ දැන්වීමට අදාළව අංක 2318/10 සහ 2023.02.06 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* සිංහල හා දෙමළ භාෂාවෙන් පළ කර ඇති සර්වේයර් ජනරාල්ගේ අංක අ.ග.පි. 192, අතිරේක අංක 8, පත්‍ර අංක 8 හි කැබලි අංක 418හි "හෙක්ටයාර් 0.0141" ක් ලෙස සඳහන් ප්‍රමාණය "හෙක්ටයාර් 0.0272" ලෙසට සංශෝධනය විය යුතු බව මෙයින් ප්‍රකාශ කරමි.

**ආර්. එම්. එස්. එන්. රත්නායක,**
ප්‍රාදේශීය ලේකම්,
තුම්පනේ.

2025 ජූලි මස 23 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
තුම්පනේ.

EOG 08 - 0103

---

## ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: DIVPANN/LND/ACBOA/1/7/21.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය*: 4-3/18/2019/WS/236.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 2427/37 හා 2025.03.15 දිනැති *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ පලකරන ලද මාගේ

දැන්වීමෙහි හිමිකම් පරීක්ෂණය පැවැත්වෙන දිනය 2025 අප්‍රේල් මස 30 යන්න වෙනුවට 2025 ඔක්තෝබර් මස 29 දින ලෙසත්, ලිඛිත තොරතුරු ඉදිරිපත් කිරීමේ දිනය 2025 අප්‍රේල් මස 23 යන්න වෙනුවට 2025 ඔක්තෝබර් මස 22 දින ලෙසත් සංශෝධනය විය යුතු බව මෙයින් නිවේදනය කරමි.

**ආර්. එම්. එස්. වික්‍රමරත්න බණ්ඩාර,**
ප්‍රාදේශීය ලේකම්,
පන්නල.

2025 ජූලි මස 31 වැනි දින,
ප්‍රදේශීය ලේකම් කාර්යාලය,
පන්නල.

EOG 08 - 0104

ශුද්ධි පත්‍රිකාව

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය*: KDS/UDB/4/1/1/153.
*කෘෂිකර්ම, පශු සම්පත් ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය*:
4-3/3/2018/FR/495.

ඉහත ශීර්ෂ යටතේ 2025.03.27 අංක 2429/33 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* මවිසින් පළ කරන ලද දැන්වීමෙ හි සඳහන් දිනයන් ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් දිනයන් ආදේශ කර එම දැන්වීම පහත පරිදි සංශෝධනය කරනු ලබන බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

| ඉවත් කළ යුතු දිනයන් | ඉවත් කළ යුතු දිනයන් වෙනුවට ආදේශ කළ යුතු දිනයන් |
|---|---|
| 2025.06.02 | 2025.11.03 |
| 2025.06.09 | 2025.11.10 |

**ජයමිණි බෝගහවත්ත,**
ප්‍රාදේශීය ලේකම්,
උඩදුම්බර.

EOG 08 - 0105

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.